**SJSW 2023 3(1) : 09-19** **Student Journal of Social Work (SJSW)**
**Volume 03 – Issue 01**

# දරිද්‍රතාවය පිටුදැකීමට ප්‍රජා සංවර්ධනයේ දායකත්වය

**Karunarathna.H.S.G.M.**[1]

[1] School of Social Work, National Institute of Social Development, Liyanagemulla, Seeduwa, Sri Lanka

**සංක්ෂිප්තය**

*ලෝක බැංකුව නිර්වචනය කරන පරිදි දරිද්‍රතාවය යනු, පුද්ගලයෙකුගේ හෝ ඇයගේ ආදායම් මට්ටම මූලික අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය අවම මට්ටමට වඩා පහත වැටේ.එවිට ඔහු දුප්පත් ලෙස සලකනු ලැබේ.ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. දරිද්‍රතාවය, කුඩා කණ්ඩායම් වල ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය, ප්‍රමාණය හා ගුණාත්මක වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන එක් සංවර්ධන ක්‍රමෝපායක් වශයෙන් ප්‍රජා සංවර්ධනය හැඳින්විය හැකිය.දරිද්‍රතාවය විසඳීමට ප්‍රජා සංවර්ධනය උපකාර කරගත හැකි වේ.එසේ හෙයින් මෙම ශාස්ත්‍ර ලිපිය සම්පාදනය කිරීමේ මූලික අරමුණ වනුයේ, දරිද්‍රතාවය පිටුදැකීමේ ප්‍රජා සංවර්ධනයේ දායකත්වය සමාජ විද්‍යාත්මක විග්‍රහයකට ලක් කිරීමයි.*

**කේන්ද්‍රීය පදඃ** දරිද්‍රතාවය, දරිද්‍රතාවයේ වත්මන් ස්වභාවය, ප්‍රජාව,ප්‍රජා සංවර්ධනය, දරිද්‍රතාවය තුරන් කිරීමට ප්‍රජා සංවර්ධනයේ දායකත්වය.

**හැඳින්වීම**

මෙකී දරිද්‍රතාවය සමාජය වෙලා ගත් ප්‍රබල සමාජ ප්‍රශ්නයකි.දරිද්‍රතාවය යන්න සරලව අර්ථ දැක්වූ විට පුද්ගලයකුගේ හෝ ප්‍රජාවකගේ දුප්පත්කම හෝ දුගී බව දරිද්‍රතාවය ලෙස හඳුන්වයි.ආසියානු සංවර්ධන බැංකුව ප්‍රකාශ කරන අන්දමට දරිද්‍රතාවය යනු , සෑම පුද්ගලයකුටම අයිතියක් ඇති අත්‍යාවශ්‍ය වත්කම් සහ ප්‍රස්තාවනා ඔවුන්ට අහිමි වීමකි.

ශ්‍රී ලංකාව ගත් විට ශ්‍රී ලංකාවේ අධික දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් මොණරාගල, මඩකලපුව, මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල ජීවත් වේ.එසේම ලෝකයේ අප්‍රිකානු රටවල් වල ප්‍රජාව අධික දරිද්‍රතාවයෙන් පෙළේ. 2014 දී ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 6.7ක් ජාතික දරිද්‍රතා මට්ටමට පහලින් සිටින බව මහ බැංකුව වාර්තා කරයි.යුරෝපය සමහර සංවර්ධිත රටවල් ඇසුරින්ද දරිද්‍රතාවය දක්නට ලැබීම විශේෂ සිදුවීමක් ලෙස දැක්විය හැකිය.ලෝක කම්කරු සංවිධානය 2012 දී ලෝකයේ සංවර්ධිත රටවල මිලියන 300කට වැඩි ජනතාවක් දරිද්‍රතාවයෙන් පෙළෙන බව වාර්තා කරන ලදී.

**<u>දරිද්‍රතාවය නිර්වචන ආශ්‍රයෙන් හැඳින්වීම.</u>**

"දුගී ධනය නැති බව දිළිඳු කමයි"

- සුමංගල ශබ්දකෝෂය-

"A Condition Characterized by sever Deprivation of Basic Human Needs Including Foods, Safe Drinking Water, Sanitation Facilities, Health Shelter,

"යහපත් ජීවිතයක් ගත කිරීමට නොහැකි වීමේ තත්ත්වයක් උදාවීම දරිද්‍රතාවයයි"

" සෑම මනුෂ්‍යයෙකුටම හිමිකමක් ඇති අත්‍යවශ්‍ය වත්කම් සහ අවස්ථා අහිමි වීම දරිද්‍රතාවයයි"

- ආසියානු සංවර්ධන බැංකුව-

" දුප්පත්කම යනු සමාජයෙන් බැහැර කර තැබීමයි"

- රීකර් සහ වෝකර් - 1997

" දුගී බව යනු පුද්ගලයකුට ආත්ම අභිමානයෙන් යුතුව ජීවිතය පවත්වාගෙන යාමට අදාළව තිබිය යුතු ශක්‍යතාවයන් නොමැති තත්ත්වය□□"

- මහාචාර්ය සෙන් - (1979)



## දරිද්‍රතාවයෙ වත්මන් ස්වභාවය

දරිද්‍රතාවය යනු ප්‍රමාණවත් මූලය සම්පත් නොමැති වීමයි.ලෝක බැංකුව විසින් නිකුත කරන ලද ගෝලීය ආර්ථික අපේක්ශා 2023 වාර්තාවට අනුව ශ්‍රී ලංකාව ඇතුලු රටවල් කිහිපයක ඇති වී ඇති ආර්ථික අර්බුද හේතුවෙන් එම රටවල දරිද්‍රතාවය ඉහළ ගොස් ඇති බව ලෝක බැංකුව පවසනු ලැබේ.

නේපාලයෙ වයඹ දිග කෙළවරේ පවුල් සිය ගණනකට ආදායම් මාර්ග අහිමි වී දරිද්‍රතාවයට තල්ලුවෙමින් ඇති බව වාර්තා වේ. නවත්ම සංගණන අනුව 2021 දී එක්සත් ජනපදයේ මිලියන 37.9ක ජනතාවක් දරිද්‍රතාවෙන් ජීවත් වෙති.2022දී වයස අවුරුදු 18ට අඩු දරුවන් දෙදෙනෙකු සිටින සිව් දෙනෙකුගෙන් යුත් පවුලක දරිද්‍රතා ආදායම් සීමාව වසරකට ඩොලර් 29,678 ක් වේ.ලොව ජනගහනයෙන් බිලියන 1.6 ආන්තික දරිද්‍රතාවයෙන් පෙළේ. ලොව ආන්තික දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගෙන් සියයට 64ක් සිටිනුයේ රටවල් 5ක වේ. එය පහත පරිදි දැක්විය හැකිය.

| රට | ජන සංඛ්‍යාප්‍රතිශතය | ආන්තික වශයෙන් දුප්පත් ප්‍රතිශතය |
|---|---|---|
| ඉන්දියාව | 18% | 33% |
| චීනය | 19% | 13% |
| නයිජීරියාව | 2% | 7% |
| බංගලාදේශය | 2% | 6% |
| කොංගෝ සමුහාණ්ඩුව | 1% | 5% |

**වගුව 1 : ශ්‍රීලංකාවේ අංශ අනුව දුගී ජනගහණය**

| | නාගරික | ග්‍රාමීය | වතු |
|---|---|---|---|
| 2006/2007 | 6.7 | 15.7 | 32.0 |
| 2009/2010 | 5.3 | 9.4 | 11.4 |
| 2012/2013 | 2.1 | 7.6 | 10.9 |

මූලාශ්‍රය :- ජන හා සංඛ්‍යාලේඛන සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2015.

දකුණු ආසියානු අනෙකුත් රටවල් වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ දරිද්‍රතා අනුපාතිකයෙන් පහලින් සිටින බව අනාවරණය කරගත හැකිය.

**<u>දරිද්‍රතා දර්ශකය</u>**

ඒක පුද්ගල ආදායම අනුව

- ඩොලර් 1.90 ට වඩා අඩු - අනිත දරිද්‍රතාවයෙන් පෙළෙන
- ඩොලර් 3.2 ට වඩා අඩු - මැදි ආදායම් ලබන රටවල දරිද්‍රතාවය මැනීමට.
- ඩොලර් 5.5 ට වඩා අඩු - ඉහළ මැදි ආදායම් ලබන රටවල දරිද්‍රතාවය මැනීමට.

**භෞතික ජීවන දර්ශකය**

මානව පීඩාව පිළිබඳ ජාත්‍යන්තර දර්ශකය.

**මානව සංවර්ධන දර්ශකය තුල දී අවධානය යොමු කරන අංශයන්.**

**ජීවිත අපේක්ෂාව**

- උපතේදී ජීවිත අපේක්ෂාව
- ස්ත්‍රී පුරුෂ ජීවිත අපේක්ෂාව
- වයස අවුරුදු 40 දී මියයන ප්‍රතිශතය
- වයස අවුරුදු 60 දී මිය යන ප්‍රතිශතය

**සාක්ෂරතාව**

- වැඩිහිටි සාක්ෂරතා අනුපාතය.
- ස්ත්‍රී පුරුෂ වැඩිහිටි සාක්ෂරතා අනුපාතය
- සාක්ෂරතාවක් නොමැති ප්‍රතිශතය


මෙහිදී සමස්තයක් ලෙස ගත් කල දකුණු අප්‍රිකානු රටවල් ආශ්‍රිතව එනම්, සෝමාලියාව ඉතියෝපියාව වැනි රටවල් අන්ත දුගී තත්ත්වයෙන් පෙළෙයි.කුඩා අවධියේදි නිසි පෝෂණය නොලැබී මියයන ප්‍රමාණය මෙහිදී ඉහලය.එමෙන්ම සාක්ෂරතාවය යනු ලිවීමට, කියවීමට ඇති හැකියාවයි.මෙකී රටවල් ආශ්‍රිතව සාක්ෂරතාවය පහළ මට්ටමක පවතී. 2023 දත්ත වලට අනුව සාක්ෂරතාවය වැඩිම රට ලෙස පින්ලන්තය 100% හඳුන්වා දිය හැකි අතර සාක්ෂරතාවය සාක්ෂරතාව අඩුම රට ලෙස Chad - 40.02% හඳුන්වා දිය හැකිය.

**10 Countries With Lowest Literacy Rates:**

1. Niger - 19.10%
2. Guinea - 30.47%
3. South Sudan - 31.98%
4. Mali - 33.07%
5. Central African Republic - 36.75%
6. Burkina Faso - 37.75%
7. Somalia - 37.80%
8. Afghanistan - 38.17%
9. Benin - 38.45%
10. Chad - 40.02%

**10 countries with the highest literacy rates in the world:**

1. Finland - 100% Literacy Rate
2. Norway - 100% Literacy Rate
3. Luxembourg - 100% Literacy Rate
4. Andorra - 100% Literacy Rate
5. Greenland - 100% Literacy Rate
6. Liechtenstein - 100% Literacy Rate
7. Uzbekistan - 100% Literacy Rate
8. Latvia - 99.89% Literacy Rate
9. Estonia - 99.82% Literacy Rate
10. Lithuania - 99.82% Literacy Rate




**ජීවන තත්ත්වය**

- ඒක පුද්ගල ආදායම
- සෞඛ්‍ය සේවාවන් හා ජලය ලබා ගැනීමට නොහැකි පුද්ගල ප්‍රතිශතය
- අවුරුදු 5ට අඩු බර දරුවන් ප්‍රතිශතය
- ආදායම් දරිද්‍රතා බොවට පහළින් ජීවත් වන ප්‍රතිශතය

**2 වගුව : ලංකාවේ දරිද්‍රතා අනුපාතය 1990 – 2019**

| වර්ෂය | දරිද්‍රතා ප්‍රතිශතය (%) |
|---|---|
| 1990/91 | 26.1 |
| 1995/96 | 28.8 |
| 2000/02 | 22.7 |
| 2006/07 | 15.2 |
| 2009/10 | 8.9 |
| 2012/13 | 6.7 |
| 2016 | 4.1 |
| 2019 | 3.2 |

**මූලාශ්‍රය :-** Department of Census and Statistics , Household Income and Expenditure Survey (2019,2016)

දිළිඳුකම පිළිබඳ අධ්‍යයනයේ දී සමෘද්ධි වැඩසටහන මෙහිදී වැදගත් වේ.ජනසවිය ආරම්භ කළ කාලයේ සිට අද දක්වා මෙරට තුළ දරිද්‍රතාවයේ ප්‍රතිශතාත්මක අඩුවීමක් මෙහිදී පෙන්වාදිය හැක. 1990 ,ලයේදී 26.1 % පැවැති දරිද්‍රතාවය 2019 වන විට 3.2% දක්වා අඩු වීමක් දැකිය හැකිය. මෙය ලබන ආදායම් හා වියදම් සමීක්ෂණය තුනෙන් ලබාගත් දත්ත අනුව පහත පරිදි පෙන්වා දිය හැක. ශ්‍රී ලංකාවේ වර්තමානය 2023 වන විට ඒකපුද්ගල ආදායම 1,088,667 ක් වේ.

**රාජ්‍යක නැතහොත් රටක දරිද්‍රතාව පවතින තත්ත්වය හඳුනා ගැනීමේ දර්ශකය.**

**ආහාර හා පෝෂණය මැන දක්වන දර්ශක**

- තුන්වේලක් ආහාර ලබා ගැනීමට හැකියාවක් නොමැති කුටුම්භ සංඛ්‍යාව
- එක් පුද්ගලයෙකුගේ දෛනික ආහාර වේලක ඇතුළත් කැලරි හා ප්‍රෝටීන ප්‍රමාණය
- මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් හා ගැබිනි මව්වරු සංඛ්‍යාව
- අඩු බරැති ළමා උපත් අනුපාතය (2 .5kgට අඩු)

**සෞඛ්‍ය දර්ශකය**

- ළදරු මරණ අනුපාතිකය (අවුරුදු 1 ට අඩු)
- ළමා මරණ අනුපාතිකය (අවුරුදු 1-5 ට අඩු)
- මාතෘ මරණ අනුපාතිකය
- සාමාන්‍ය ආයු අපේක්ෂණය
- ජනසංඛ්‍යාවෙන් දහසකට හිමිවන රෝහල් ඇඳන් සංඛ්‍යාව
- එක් වෛද්‍යවරයෙකුට සිටින රෝගීන් සංඛ්‍යාව

**අධ්‍යාපන දර්ශකය**

- සාක්ෂරතාව
- පාසල් යා යුතු වයසේ පසුවන දරුවන් පාසල් නොයන අනුපාතය
- පාසල් හැර යන්න වුන්ගේ අනුපාතය
- පාසල් සංඛ්‍යාව හා පහසුකම්

**නිවාස මට්ටම පිළිබඳ දර්ශක**


- නිවාස තත්වය ( ස්ථිර , තාවකාලික හා පැල්පත්)
- ඉඩකඩ හා වාතාශ්‍රය
- සනීපාරක්ෂක පහසුකම්

**වගු අංක 2 : දරිද්‍රතාවය මැනීම සඳහා දර්ශක**

| මූල්‍යමය මිනුම් | මූල්‍යමය නොවන මිනුම් | |
|---|---|---|
| මූලික අවශ්‍යතා සඳහා යන වියදම් (CBN) | HDI දර්ශක* | HPI දර්ශක* |
| •ආදායම /පරිභෝජනය | • ජීවිත අපේක්ෂාව<br>• වැඩිහිටියන්ගේ සාක්ෂරතා අනුපාතිකය<br>• මූර්ත ඒක පුද්ගල දළදේශීය නිෂ්පාදිතය | • වයස අවුරුදු 40 ට පෙර මරණයට පත්වන ජනගහනයේ ප්‍රතිශතය<br>• වැඩිහිටියන්ගේ සාක්ෂරතා අනුපාතිකය<br>• පිරිසිදු පානීය ජල පහසුකම් ලබාගැනීමට ඇති නොහැකියාව<br>• වැසිකිළි නොමැති නිවාස සංඛ්‍යාව<br>• විධිමත් සෞඛ්‍ය පහසුකම් වලින් සමන්විත වෛද්‍ය ආයතන වලින් පරිභාහිරව සිදුවන උපත්වල අනුපාතිකය<br>• ප්‍රතිශක්තිකරණ එන්නත් ලබානොදුන් ළමුන් ගේ අනුපාතිකය<br>• ප්‍රතිශක්තිකරණ එන්නත් ලබානොදුන් ගැබිණි මව්වරුන්ගේ අනුපාතිකය<br>• විදුලිබලය සඳහා ප්‍රවේශය නොමැතිව සිටින ජනගහනයේ අනුපාතිකය |

*මූලාශ්‍රය : UNDP - ශ්‍රී ලංකාව 1998

**2 රූප සටහන : දිස්ත්‍රික්කයන් අනුව ජනගහන දරිද්‍රතා දර්ශකය**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විවිධ වර්ෂයන්

□□ස්ත්‍රික්කයන් සැසඳීමේ දී 2009/10 කාල පරිච්ඡේදයේ දී ජනගහන දරිද්‍රතා දර්ශකයේ වැඩිම අගයන් 20.3% (නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද දරිද්‍රතා රේඛාවට පහතින් සිටින ජනගහනයේ ප්‍රතිශතය ) වාර්තා වන්නේ මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වන අතර අඩුම සංඛ්‍යාව 2.3% වාර්තා වූයේ වව්නියා දිස්ත්‍රික්කයෙනි. දෙවන රූප සටහනට අනුව 2009/10 කාල පරිච්ඡේදය තුළ දී දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතා මට්ටම් කොළඹ දිස්ත්‍රික්කය 3.6% සිට මොනරාගල දිස්ත්‍රික්කයේ 14.5% දක්වා පරාසයක පිහිටයි . සියලුම දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතා මට්ටමින් කැපී පෙනෙන අඩුවීමක් 2006/2007 සිට දක්නට ලැබේ.




<u>**ප්‍රජාව පිළිබඳ හැඳින්වීම**</u>

*Kingsley Davis* ට අනුව ප්‍රජාව යනු සමාජ ජීවිතයේ ආශා බුක්ති විඳින කුඩාම ප්‍රදේශවාසී කණ්ඩායමයි.එසේ හෙයින් ප්‍රජාවක් යනු අවශ්‍යයෙන්ම සමාජ ජීවිත ගත කරන ප්‍රදේශයෙකි.මේ අනුව ප්‍රජාව යනු සීමා සහිත ප්‍රදේශයක් තුළ සම්පූර්ණ වූ සමාජ ජීවිත සංවිධානයකි.ගම ,නගරය,ගෝත්‍රය,පුරය,දිස්ත්‍රික්කය නිදසුන් ලෙස දැක්විය හැකිය.ප්‍රජාව සතු මූලිකාංග කිහිපයකි.එනම්,පිහිටි ප්‍රදේශය හා ප්‍රජා මනෝභාවයයි. මෙහිදි පිහිටි ප්‍රදේශයක් යන්නෙන් අදහස් වෙන්නෙ.භෞතික පදනම වේ. උදාහරණ ලෙස ගත් විට එඩේර ප්‍රජාවට ඔවුන්ගේ වාසස්ථාන වෙනස් වුවද ඔවුන්ට ප්‍රදේශයක් පැවතීම දැක්විය හැකිය.මෙහිදී ප්‍රජා මනෝභාවය යනුවෙන් අදහස් වනුයේ හවුලේ අයිතිය පිළිබඳ හැඟීම වේ.නිදසුනක් ලෙස " අපේය යන හැඟීම" ප්‍රජාව තුළ වර්ධනය වීම.ස්ථාවරත්වය, ස්වභාවිකත්ව සම්බන්ධතා නියාමනය යන දිශානතීන් ප්‍රජාව හා සම්බන්ධ තවත් දෘෂ්ටීන් ලෙස දැක්විය හැකිය.

**ප්‍රජා සංවර්ධනය පිළිබඳ හැඳින්වීම**

ප්‍රජා සංවර්ධනය යනු සාමාජිකයින්ට තමන්ට වැදගත් වන ගැටලු සම්බන්ධයෙන් සාමූහික ක්‍රියාමාර්ග ගන්නා ක්‍රියාවලියයි.ප්‍රජා සංවර්ධනය තුළින් ප්‍රජා සාමාජිකයින් සවිබල ගැන්වීම සහ ශක්තිමත් ප්‍රජාවක් ඒ ඔස්සේ නිර්මාණය කරනු ලැබේ.ප්‍රජා සංවර්ධන වැඩසටහන් සෑම අදියරකදීම ප්‍රජා සාමාජිකයින් විසින් මෙහෙයවනු ලැබේ.මෙකී ප්‍රජා සංවර්ධන ආකාර තුනකින් හඳුනාගත.එනම් ප්‍රජාවට බලපාන වැදගත් ගැටළු ගැටලු හඳුනා ගැනීමට සහ

ඇගයීමට අවශ්‍ය සම්පත් සැපයීම,ප්‍රජාව සහ අසල්වැසි සාමාජිකයන් සම්බන්ධ සාමාජිකයින් සම්බන්ධීකරණය සිදු කිරීම, වඩාත් ඵලදායි නාලිකා හරහා ප්‍රජා හඬ විස්තාරණය කර නිවැරදි ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම.

එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රජා සංවර්ධනය යන අර්ථ දක්වනු ලබන්නේ ප්‍රජාව ගේ විභවතා ශක්තීන් මත පූර්ව විශ්වාසය තබමින් ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ද සහිත ව සමස්ත ප්‍රජාවගේ සමාජ ආර්ථික ප්‍රගතිය ට අදාල තත්වයක් නිර්මානය කිරීමේ ක්‍රියාවලියක් වශයෙනි.මෙකී ප්‍රජා සංවර්ධනය හරහා ප්‍රජාවගේ ශක්‍යතාව වර්ධනය සිදු කරනු ලැබේ.ප්‍රජාව ගේ හැකියාවන් හා විශ්වාස මත සාමූහිකව ක්‍රියා කර ගැටලු විසඳා ගනිමින් ප්‍රජාවගේ අවශ්‍යතා තෘප්ත කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රජා සංවර්ධනය ලෙස පෙන්වා දිය හැක.

**ප්‍රජා සංවර්ධනය දායකත්වය**

මෙකී ප්‍රජා සංවර්ධන දායකත්වය හරහා දරිද්‍රතාව තුරන් කර හැකි වේ.100% නාගරීකරණයට ලක් වූ සිංගප්පූරුව වැනි රටවල් වල දරිද්‍රතාවය මැඩ පවත්වා තිබේ.එහි ජීවත්වන ප්‍රජාවට ඇත්තේ ඉතා ඉහළ ජීවන තත්ත්වයකි.ජපානය වැනි රටවල් වල ද සෞඛ්‍ය පහසුකම් ඉහළ මට්ටමකින් පවතින නිසා මන්දපෝෂණයෙන් පෙළෙන ප්‍රජාවක් එහි දැකගත නොහැකිය.ශ්‍රී ලාංකීය ප්‍රජාව ගත් විට ඔවුන් දැඩි ආර්ථික අහේනියෙන් පෙළෙනු ලැබේ.ඉන්දියාවේ විශාලතම මුඩුක්කු සංකීර්ණය වන ධරාවි මුඩුක්කු පැල්පත් වාසීන් ද අධික දරිද්‍රතාවයෙන් ජීවත් වේ.ඔවුන්ට එහි වාසි වාසස්ථාන ඉදිකර දීම පෝෂණීය ආහාර වේල් ලබාදීමට ද කටයුතු කළ යුතු වේ.තිරසාර සංවර්ධන ඉලක්ක ලෝක නායකයන් විසින් 2015 සැප්තැම්බර් මාසයේදී එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ දී සම්මත කර ගන්නා ලදී.සහස්‍ර සංවර්ධන ඉලක්ක යටතේ දරිද්‍රතාව තුරන් කිරීම ඔවුන්ගේ අභිප්‍රාය වේ.එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම සංවර්ධන ඉලක්ක බවට පත්වී ඇත්තේ 2030 වනවිට ලෝකයෙන්ම දරිද්‍රතාවය තුරන් කිරීමයි.

දරිද්‍රතාවය මෙසේ මුළු ලෝකයෙන් තුරන් කිරීමට නම් වසරකට ඇමෙරිකානු ඩොලර් බිලියන හය සීයයක් අවශ්‍ය වන බව ලෝක කම්කරු සංවිධානය ප්‍රකාශයට පත් කරන ලදී.ලංකාවේ ප්‍රජාවට සමෘද්ධි සහනාධාර ලබා දීම , වැඩිහිටි ආධාර ලබා දීම , විවිධ ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම හරහා දරිද්‍රතාවයෙන් පෙලෙනවුන් හට ප්‍රජා සංවර්ධන සාමාජිකයින් මෙසේ අතහිත දෙනු ලැබේ.එමෙන්ම තිරසාර සංවර්ධන ප්‍රතිපත්තිය හරහා ද දුගීකම වැඩ ලිය හැකිය.

දරිද්‍රතාව පිටුදැකීමට ගෙන ඇති වැඩසටහන්.

***ජන සවිය***

1989 - 1995 දී ජනසවිය ආරක්ෂක ජාල සහ දිළිඳුකම පහත හෙළීමේ ප්‍රධාන වැඩසටහනක් විය.

ඉලක්ක කළේ, අඩු ආදායම්ලාභී පවුල් නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගී කර ගැනීමෙන් ඔවුන්ට ස්ථිර ඉපැයීම් විභවයක් ස්ථාපිත කිර ගැනීමටයි.

කෘෂිකාර්මික කටයුතු සඳහා ණය පහසුකම් ලබා දුනි.

නිවාස වැඩි දියුණු කිරීම සඳහා ණය ලබා දෙන ලදී.

***සමෘද්ධිය***

1995 දී ආරම්භ කරන ලදී.

දිළිඳුකම පහත හෙළීමේ ඒකාබද්ධ ප්‍රයත්නයක් ලෙස මෙම වැඩසටහන මඟින් ආහාර මුද්දර සහ දිවා ආහාර වැඩසටහන් ප්‍රතිෂ්ඨාපනය කර ඇත.

**සමෘද්ධි වැඩසටහනේ ලක්ෂණ**

අඩු ආදායම්ලාභී පවුල්වලට එදිනෙදා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට මාසික දීමනාවක් ලබාදීම.

සමාජ ආරක්ෂක වැඩසටහන් තිබීම.විපත්, මරණ , අත්‍යවශ්‍ය සාමාජික කටයුතු සඳහා සහන සැලසීම.

ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපනය ,වියළි කලාපීය වැව් සංවර්ධනය ,ප්‍රජා වැඩසටහන් ,ජල සම්පාදනය හා සනීපාරක්ෂක වැඩසටහන , ග්‍රාමීය මාර්ග සංවර්ධනය,බැංකු සමාගම් ව්‍යාපාරයක් තිබීම.එනම් දිළිඳු ප්‍රජාව ගේ ඉතුරුම් වර්ධන ණය පහසුකම් සපයාදීම, බැංකු ඇති කිරීම.

දිළිඳුකමේ වැඩිම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තෝරාගෙන තෝරා මෙම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.උදා ස්වයං රැකියා ව්‍යාපෘති ,ජල සැපයුම් සනීපාරක්ෂක තත්ත්වයන් වැඩි දියුණු කිරීම.

වගුව 4 : සමෘද්ධි ප්‍රතිලාභීන් ප්‍රමාණය 2013 - 2020

| වර්ෂය | සමෘද්ධි ප්‍රතිලාභීන් ගණන |
|---|---|
| 2013 | 1,477,173 |
| 2014 | 1,479,811 |
| 2015 | 1,453,078 |
| 2016 | 1,407,235 |
| 2017 | 1,388,242 |
| 2018 | 1,384,021 |
| 2019 | 1,800,182 |
| 2020 | 1,770,086 |

මූලාශ්‍රය :- Central Bank of Sri Lanka , Annual Reports (2020,2019,2018,2017)

මෙකී ගෘහ ආදායම් හා වියදම් සමීක්ෂණ දත්ත අනුව දරිද්‍රතාවය අවම මට්ටමකින් පවත්වාගත හැකිවේ.මෙකී සමෘද්ධි ව්‍යාපාරය දිළිඳුකම පිටුදැකීමට ප්‍රබල හේතුවක් වේ.සමෘද්ධි ලබන ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර මෙම වගුවෙහි දැක්වේ.

මෙහිදී 2013 වර්ෂයෙදී සමෘද්ධිය ලැබෙන සමෘද්ධි ප්‍රතිලාභීන් ගණන සංඛ්‍යාත්මක වශයෙන් 1,477,173 ක් වේ.එය 2020 වන විට 1,770,086 ක් දක්වා ඉහළ අගයක් ලබා තිබේ. 2013 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය තුළදී සමෘද්ධිය ලැබෙන සමෘද්ධි ප්‍රතිලාභීන් 322,913 ක වැඩි වීමක් ද දක්නට ලැබේ.

**සමාලෝචනය**

මෙකී දරිද්‍රතාවය ආර්ථික තත්වය වෙනස් වීමත් සමග ඉහළ පහළ යාමක් දැකිය හැකි වේ.දරිද්‍රතාවයෙන් මැනීමට නිරපේක්ෂ හා සාපේක්ෂ මිනුම්දඬු භාවිතයට ගනු ලැබේ.ප්‍රජාවට තමන්ගේ මූලික අවශ්‍යතා සපුරා සපුරා ගැනීමට නොහැකි වීම නිරපේක්ෂ දරිද්‍රතාව යයි.සාපේක්ෂ දරිද්‍රතාවය යනු තමන්ගේ ජීවන මට්ටම පවත්වා ගැනීමට අවශ්‍ය කරනු ලබන අවම ආදායම තත්ත්වයක් නොමැති වීමයි.ප්‍රජාව ඔවුන්ගේ සංවර්ධන ඉලක්ක ජය ගැනීමට උත්සුක වේ.මෙලෙස සමස්තයක් ලෙස ලෝකය පුරා පවත්නා දරිද්‍රතාවය පිටුදැකීමේ උදෙසා සමාජ,දේශපාලනික හා ආර්ථික ,අධ්‍යාත්මික අංශවල ගුණාත්මක වර්ධනය ප්‍රජා සංවර්ධන ක්‍රියාවලිය හරහා සිදුවෙයි.මෙහිදී ප්‍රජාව තමන්ගේ පොදු අරමුණු සාක්ෂාත් කරගනු ලැබේ.

මෙලෙස දුගී කම තුරන් කිරීම සඳහා ප්‍රතිලාභීන් දිරිගැන්විය යුතු වේ.මෙලෙස යහපත් ප්‍රතිලාභ ඇතිකර ගැනීමට ප්‍රජාවගේ ඍජු හා වක්‍ර දායකත්වය අත්‍යවශ්‍ය වේ.2023 වන විට සමෘද්ධි අස්වැසුම නම් නව ක්‍රමවේදයක් ප්‍රජාවට සමෘද්ධි සංගමය විසින් හඳුන්වා දෙනු ලැබේ.නවතම චක්‍රලේඛ අනුව ප්‍රකාශ කරන්නේ, සමෘද්ධි සහනාධාර ලැබෙන ප්‍රජාව තම ස්ව ශක්තිය තුළින් තම ජීවනෝපාය නවමු දිශානතියකට යොමු කරලීමට අවශ්‍ය ආර්ථික ශක්තිය රජය මගින් සිදු කරනු ලැබීමයි.මේ ඔස්සේ දුගී ප්‍රජාවට පුහුණු ශ්‍රමය යටතේ රැකියාවල නිරත වීමට හැකි වේ. මෙලෙසින් දරිද්‍රතාවය නම් කේන්ද්‍රීය වූ සංකල්පය ක්‍රියාවලිය මැඩලීමට මෙපරිද්දෙන් ප්‍රජාවගේ දායකත්වය ඉවහල් විය යුතුවේ.

**<u>ආශ්‍රිත ග්‍රන්ථ</u>**


- ධනපාල .ඒ. එච් 2018 මානව භූගෝල විද්‍යාව
- මායාදුන්න මිලින්ද 2018 සමාජ විද්‍යාවේ මූලිකාංග
- https://www.investopedia.com/terms/p/poverty.asp
- https://www.compassionuk.org/blogs/poverty-101-what-is-poverty/
- https://communities.extension.uconn.edu/what-is-community-economic-development/
- https://www.nacdep.net/what-is-community-development-
- https://aifs.gov.au/resources/resource-sheets/what-community-development
- https://friday.us/community-development/
- https://www.future.edu/2022/10/community-development/
- https://www.datapandas.org/ranking/literacy-rate-by-country